# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1991/43 - 2016 නොවැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 139 වන වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලැබුවා වූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන කැළණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වා ඇති (2015 දෙසැම්බර් මස 30 වන දින අංක 1947/24 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) 2006 ජූලි මස 22 වන දින අංක 1454/37 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇති නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දක්වා ඇති ''වෛද්‍ය පීඨය'' යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දක්වා ඇති ''16. ආබාධිතතා අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''17. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 නොවැම්බර් මස 01 වැනි දින.
කොළඹ දී ය.

11 - 859


1A - PG 3212 — 508 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*